**දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතිය (CRIWMP) - 2024**

---

දේශගුණික විපර්යාසයන්ට අනුහුරුවීම සඳහා වූ ඒකාබද්ධ ජල කළමනාකරණ ව්‍යාපෘතියේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන හරිත දේශගුණික අරමුදල (GCF) සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) 2016 අගෝස්තු 05 දින එළඹි ප්‍රධාන ගිවිසුමේ 17.01(ආ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකා බලන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවෙ හි දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුම අනුව, වාරිමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ජාතික ප්‍රජා ජල සම්පාදන දෙපාර්තමේන්තුව, ජාතික ජල සම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය සහ ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.

දේශගුණික විපර්යාසවලට අවදානම සහ බලපෑම්වලට එරෙහිව ආහාර සුරක්ෂිතතාව, සෞඛ්‍ය සහ යහපැවැත්ම ආරක්ෂා කිරීම සඳහා ජල කළමනාකරණය සඳහා ඒකාබද්ධ ප්‍රවේශයක් තුළින් වියළි කලාපයේ කුඩා වතු හිමියන්ගේ, විශේෂයෙන් කාන්තාවන්ගේ ජීවන සහ ජීවනෝපාය වැඩිදියුණු කිරීම සහ ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා වන ශ්‍රී ලංකා රජයේ දැක්මට සහාය වීම ව්‍යාපෘතියේ අරමුණු වේ. වියළි කලාපයේ ගංගා ද්‍රෝණි තුනක ග්‍රාමීය වාරිමාර්ග පද්ධතියේ ප්‍රත්‍යස්ථාව වැඩිදියුණු කිරීම සහ දේශගුණයට ඔරොත්තු දෙන ගොවිතැන් ක්‍රම පුළුල් කිරීම, අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ට සුරක්ෂිත පානීය ජලය සඳහා වසර පුරා ප්‍රවේශය ලබා දීම සඳහා දේශගුණයට ඔරොත්තු දෙන විමධ්‍යගත ජල සැපයුම සහ කළමනාකරණ විසඳුම් වැඩිදියුණු කිරීම, කුඩා වතු හිමියන්ගේ ජල කළමනාකරණය සහ නියඟයට අනුවර්තනය වීමේ හැකියාව වැඩි දියුණු කිරීම සඳහා දේශගුණය සහ ජල විද්‍යාත්මක නිරීක්ෂණ සහ පුරෝකථන පද්ධතිය ශක්තිමත් කිරීම සහ ගංවතුර සහ ව්‍යාපෘති කළමනාකරණය යන අංග හතරක් යටතේ ක්‍රියාත්මක වේ.

ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු. මිලියන 7,521.45 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 52.084 ක් වූ අතර එයින් රු. මිලියන 5,499.71 ට සමාන ඇමෙරිකානු ඩොලර් මිලියන 38.084 ක් හරිත දේශගුණික අරමුදල(GCF) විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු. මිලියන 2,021.74 ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යකරණය කිරීමට බලාපොරොත්තු වේ.

ව්‍යාපෘතිය 2017 ජූලි මස එහි කටයුතු ආරම්භ කර 2024 ජූනි මාසය වන විට අවසන් කිරීමට නියමිතව තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ කටයුතු අවසන් කළයුතු දිනය 2025 දෙසැම්බර් 28 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 මතය ව්‍යාචනය

ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් මතයක් ප්‍රකාශ නොකරමි. මගේ වාර්තාවේ 2.1 කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීම සඳහා ප්‍රමාණවත් උචිත සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ

තවදුරටත් විස්තර කර ඇත. විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය පරීක්ෂා කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

### 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වෙතත්, මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන්, මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමානවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | වටිනාකම රු. මිලියන | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | හරිත දේශගුණික අරමුදල විසින් (GCF) විසින් එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන (UNDP) වෙත සමස්ත වශයෙන් රු. මිලියන 9,172 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන38.084ක සමාන මුදලක් ලබා දී තිබුණි. කෙසේ වෙතත්, 2024 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 4,745.93 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 18.85 ක් පමණක් ජේකීය අමාත්‍යාංශයට ලබා දී තිබූ අතර, රු. මිලියන 3,444.05ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 15.75 ක මුදලක් UNDP මඟින් ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීමට වැය කර තිබුණි. ඒ අනුව රු. මිලියන 1,019.64 ට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 3.48 ක ශේෂ අරමුදල UNDP විසින් රදවාගෙන තිබුණි. සම්පූර්ණ විසර්ජනයෙන් | 1,019.64 | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට ලැබුණු අරමුදල් සඳහා පමණක් වන අතර එය මුළු බෙදාහැරීම් ප්‍රමාණයෙන් සියයට 49 ක් නියෝජනය කරනු ලබයි. UNDP විසින් සෘජුවම වියදම් කර ඇති මුදල් සහ එම ආයතනය විසින් රඳවාගෙන ඇති ශේෂ මුදල් මෙම ප්‍රකාශන තුළ පෙන්වා නොමැත. | මූල්‍ය දායකත්වය ලබාදෙන නියෝජිතායතනය විසින් ලබා දෙන අරමුදල් මහ බැංකුව හරහා ලබාගෙන ව්‍යාපෘතියේ අරමුණ සඳහා භාවිතා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | සියයට 50ක් පමණක් නියෝජනය කරන ක්‍රියාත්මක කිරීමේ ආයතනයට ලබාදී ඇති මුදල සඳහා පමණක්, මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබූ බැවින්, සමස්ත ව්‍යාපෘතියේ මූල්‍ය කාර්යසාධනය සහ මූල්‍ය තත්ත්වය පිළිබිඹු නොවූ අතර, විගණන කටයුතු ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වලට සීමා විය. | | | |
| (ආ) | රු. මිලියන 20.89 ක වටිනාකමින් යුත් අනුමත ණය මුදලින් ලබා නොගත් ප්‍රමාණයට අය කෙරෙන ගාස්තු (Commitment Fee) මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘති වියදම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් පෙන්වා තිබුණි. | 20.89 | කැපවීමේ ගාස්තු (Commitment fees) සහ හිඟ අත්තිකාරම් (Deficit advances) ව්‍යාපෘති ගිණුම්වල පිළිබිඹු නොවේ. | කැපවීමේ ගාස්තු (Commitment charges) ගිණුම්ගත කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 352.52 ක බැර ශේෂයක් ඇතුළත් කර නොතිබීම හේතුවෙන් වගකීම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | 352.52 | මෙම මුදල සැසඳුම් කරන සහ එය සමුච්චිත ව්‍යාපෘති වටිනාකමට ඇතුළත් කර ඇති ආකාරය පෙන්වන සවිස්තරාත්මක උපලේඛනයක් අප විසින් සකස් කර මෙයට අමුණා ඇත. මෙම මුදල අත්හැරීමක් නොවන අතර එය සමස්ත ව්‍යාපෘති මූල්‍යකරණයේ කොටසක් වේ. එමෙන්ම, වාර්තා කර ඇති පරිදි ව්‍යාපෘතියේ මුළු වටිනාකම සමඟ මෙය සමපාත වන බව එම උපලේඛනය මගින් පෙන්නුම් කරයි. මෙම සැසඳුම මගින් සමුච්චිත අරමුදල් වාර්තා කිරීමේ අනුකූලතාවය සහ විනිවිදභාවය සහතික කෙරේ. | සියලුම ගනුදෙනු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කිරීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති රෙගුලාසිවලට අනුකූල නොවීම්

| | නීති රීති රෙගුලාසිවලට යොමුව | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (Funded Activity Agreement - FAA) 2.01 වගන්තිය. | ප්‍රතීතනයට ලත් ආයතතනය (UNDP) "ක්‍රියාත්මක කිරීමේ ආයතනය විසින් අරමුදල් සපයන ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සුපරීක්ෂණය සහ අධීක්ෂණය කළ යුතුය". යන වගන්තිය නොසලකා හරිමින් ප්‍රතීතනයට ලත් ආයතතනය (UNDP) ව්‍යාපෘති කටයුතු ක්‍රියාවට නැංවීමේ නිරත වී තිබූ අතර 2017-2024 කාලසීමාව තුළ රුපියල් මිලියන 3,444.12 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 15.75 ක් වූ මුළු වියදමෙන් සියයට 44.7 ක ප්‍රමාණයක් දරා ඇත. | වාරිමාර්ග අමාත්‍යාංශය සහ මුදල් අමාත්‍යාංශය සමඟ අත්සන් කරන ලද අදාළ ගිවිසුම්වලට අනුකූලව ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කළ බව UNDP ආයතනය ප්‍රකාශ කළේය. කෙසේ වෙතත්, එවැනි වෙනස්කම් සිදු කිරීමට ගිවිසුම් මගින් කිසිදු බලතලයක් ලබා දී නොමැති පසුබිමක රජයේ, අමාත්‍ය මණ්ඩලයේ හෝ GCF (හරිත දේශගුණික අරමුදල) අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2020 වසරේදී එකඟ වූ මුදල් බෙදාහැරීමේ ක්‍රියාවලිය (Disbursement process) වෙනස් කර ඇති බව ව්‍යාපෘති කණ්ඩායම සහ විගණකවරුන් විසින් සොයා ගන්නා ලදී. | අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමට (FAA) අනුව, ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ ආයතනය (Executing agency) විසින් ක්‍රියාත්මක කළ යුතු අතර, ප්‍රතීතනය ලත් නියෝජිත ආයතනය (Accredited agency) විසින් ඒවා අධීක්ෂණය සහ සුපරීක්ෂණය කළ යුතුය. |
| (ආ) | අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) අරමුදල් යෝජනාවේ 'B' කොටස. | 2024 වර්ෂය අවසානය දක්වා හරිත දේශගුණික අරමුදලෙන් (GCF) රුපියල් මිලියන 4,745.93 ක මුදලක් සහ ශ්‍රී ලංකා රජයෙන් රුපියල් මිලියන 2,818.87 ක මුදලක් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත ලැබී තිබුණි. අරමුදල් සහිත ක්‍රියාකාරකම් ගිවිසුමේ (FAA) අරමුදල් යෝජනාවේ 'B' කොටසට අනුව, ව්‍යාපෘතියේ මුළු අයවැයෙන් ශ්‍රී ලංකා රජයේ දායකත්වය සියයට 27 ක් වන අතර හරිත දේශගුණික අරමුදලේ දායකත්වය සියයට 73 ක් විය යුතුය. ව්‍යාපෘතිය සඳහා හරිත දේශගුණික | ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ (PMU) පාලනයෙන් බැහැර වූ මෙම කරුණ පිළිබඳව මීට පෙරද දැනුම් දී ඇති අතර හරිත දේශගුණික අරමුදල් (GCF) සම්පූර්ණයෙන්ම සහ නියමිත වේලාවට ලබා ගැනීම සහතික කිරීම සඳහා UNDP සහ අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කිරීමට පියවර ගනිමින් පවතී. | අරමුදල් යෝජනාවේ (Funding Proposal) කොන්දේසිවලට අනුව, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) වෙත ලැබෙන මුදල් ප්‍රමාණය මත පදනම්ව රජයේ දායකත්වය නිදහස් කළ යුතුය. |

අරමුදලෙන් රුපියල් මිලියන 4,745.93 ක් ලැබී තිබුණද, එය මුළු ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 62.74 ක් පමණක් විය. මෙහි ප්‍රතිඵලයක් ලෙස, 2017-2024 කාලසීමාව තුළ ශ්‍රී ලංකා රජය විසින් ව්‍යාපෘති පිරිවැයෙන් සියයට 37.26 කට සමාන රුපියල් මිලියන 2,818.87 ක මුදලක් වැය කර තිබුණි.

## 3. භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික ප්‍රගතිය

| | විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යාපෘතියේ 2024 වර්ෂය සඳහා වූ වියදම් ඇස්තමේන්තු ලේඛනයට අනුව, ක්‍රියාකාරකම් 21 ක මූල්‍ය ප්‍රගතිය ශූන්‍ය ලෙස වාර්තා කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වේ. | ව්‍යාපෘති කටයුතු සැලසුම් කළ පරිදි ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | මන්නාරම දිස්ත්‍රික් යටිගම් සංවර්ධන වැඩසටහන යටතේ, සින්නප්පුච්චිකුලම් එල්ලංගාවට අයත් වැව් 7ක් සංවර්ධනය කිරීම සඳහා රුපියල් මිලියන 25.2ක මුදලක් (එක් වැවකට රුපියල් මිලියන 3.6 බැගින්), 2023 නොවැම්බර් 29 දින මන්නාරම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත නිදහස් කර තිබුණි. කෙසේ වෙතත්, මෙම වැව් 7 සංවර්ධනය සඳහා එම අරමුදල් භාවිතා කළ යුතු ආකාරය පිළිබඳ කිසිදු සාරාංශ ඇස්තමේන්තුවක් හෝ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ උපදෙස් මාලාවක් ඉදිරිපත් වී නොතිබුණි. එසේම, 2025 ජනවාරි 15 දින වන විටත්, මෙම අරමුදල් වියදම් කිරීම සම්බන්ධ කිසිදු මූල්‍ය හෝ භෞතික ප්‍රගතියක් ව්‍යාපෘතිය වෙත වාර්තා කර නොතිබුණි. | තාක්ෂණික කාර්ය මණ්ඩලය නොසිටීම හේතුවෙන් මෙම ප්‍රමාදතාවය සිදුවිය. දැනට එම වැඩ කටයුතු ආරම්භ කර ඇත. | නිදහස් කරන ලද අරමුදල් අදාළ කාර්යයන් සඳහා ඵලදායී ලෙස යොදා ගන්නේද යන්න තහවුරු කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ඇ) | වැව්ගම් පුබුදුව ව්‍යාපෘතිය යටතේ ග්‍රාමීය වාරි පද්ධති (VIS) ප්‍රතිසංස්කරණය කිරීමේ අධීක්ෂණ සහ සුපරීක්ෂණ උපදේශක සේවා සඳහා 2023 නොවැම්බර් මාසයේ සිට MCB ආයතනයෙන් | ව්‍යාපෘති ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය මත සහ මහවැලි උපදේශක කාර්යාංශය (MCB) විසින් | ව්‍යාපෘතිය විසින් අමාත්‍ය මණ්ඩලය අනුමත කළ ගාස්තු සීමාවන් දැඩි ලෙස අනුගමනය කළ යුතුය. |

| | |
|---|---|
| විශේෂඥයකුද ලබාගෙන ඇත. 2023 නොවැම්බර් සිට 2024 ඔක්තෝබර් දක්වා මෙම විශේෂඥ සේවාව වෙනුවෙන් MCB ආයතනයට ගෙවන ලද මුළු මුදල රුපියල් මිලියන 11.39 කි. ඒ සඳහා සේවා පිරිවැයෙන් උපරිම 1.5% ක සේවා ගාස්තුව ඉක්මවා යමින්, 16.5% ක සේවා ගාස්තුවක් MCB ආයතනය වෙත ගෙවා ඇත. 2023 නොවැම්බර් සිට සේවා ගාස්තු ලෙස ගෙවා ඇති මුළු වටිනාකම රුපියල් මිලියන 1.37 ක් (16.5%) බව නිරීක්ෂණය විය. එසේම, 2021 ජුනි 25 දිනැති අංක 21/0967/314/026 දරන අමාත්‍ය මණ්ඩල තීරණයට පටහැනිව එම මුදලින් රුපියල් මිලියන 1.24 ක් (15%) අදාළ ආයතනය වෙත ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | ඉදිරිපත් කරන ලද පිරිවැය පිරිවිතරයන් පදනම් කරගෙන, එම කාර්යාංශය හරහා තාක්ෂණික විශේෂඥයෙකුගේ සේවය ලබා ගන්නා ලදී. ඒ අනුව, ගිවිසුම්ගත පාර්ශවකරු වූයේ MCB ආයතනය වන අතර සිදු කරන ලද සියලුම ගෙවීම් ඔවුන් හරහා ලබා දුන් සේවාවන් සඳහා වූ අනුමත ගිවිසුම් කොන්දේසි වලට අනුකූල වේ. |

### 3.2 වැඩ බිම් නිරීක්ෂණය

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට දේශගුණික හා කෘෂිකාර්මික උපදේශන සේවා ව්‍යාප්ත කිරීම සඳහා සහාය වීමේ අරමුණින් දිස්ත්‍රික්ක හතක ගොවිජන සේවා මධ්‍යස්ථාන 'දැනුම් කේන්ද්‍රස්ථාන' (Knowledge Hubs) ලෙස ශක්තිමත් කිරීමේ ව්‍යාපෘතිය යටතේ, ගොවිජන සේවා මධ්‍යස්ථාන 46ක් සඳහා අඟල් 65ක LED රූපවාහිනී යන්ත්‍ර ලබා දීමට රුපියල් මිලියන 13.72ක වියදමක් දරා තිබුණි. මෙම රූපවාහිනී යන්ත්‍ර ලැබුණු මධ්‍යස්ථාන හයක් ආවරණය වන පරිදි සිදුකළ ක්ෂේත්‍ර පරීක්ෂාවකදී හෙළි වූයේ, ඉන් මධ්‍යස්ථාන දෙකක් (මරදන්කඩවල සහ මිහින්තලේ) පමණක් ඒවා කෘෂිකාර්මික උපදේශන ව්‍යාප්ති සේවා සඳහා ප්‍රධාන වශයෙන් පුහුණු වැඩමුළු සඳහා භාවිතා කර ඇති බවයි. අනෙක් මධ්‍යස්ථාන එම උපකරණ අපේක්ෂිත අරමුණ සඳහා භාවිතා කර නොතිබුණි. තවද, මෙම වැඩපිළිවෙළේ මූලික අරමුණ වූ දේශගුණික උපදේශන සේවා විකාශනය කිරීම සඳහා 'ඩිජිටල් ජාල පද්ධතියක්' (Digital network system) ස්ථාපිත කිරීම, විගණනය සිදුකළ 2025 ජූලි 24 දින වන විටත් සංවර්ධනය කර නොතිබුණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස සම්පත් ඌන භාවිතයට ලක්වීම සහ ව්‍යාපෘතියේ මූලික ඉලක්ක සපුරා ගැනීමට අපොහොසත් වී තිබුණි. | අධීක්ෂණ සහ ඇගයීම් විශේෂඥ (Monitoring & Evaluation Specialist) තනතුර ව්‍යාපෘතියේ ප්‍රධාන භූමිකාවක් ලෙස අනුමත කර තිබුණද, වැටුප් මට්ටම් පිළිබඳ පවතින අතෘප්තිමත්භාවය හේතුවෙන් නිලධාරීන් නැවත නැවතත් ඉල්ලා අස්වීම නිසා එම තනතුරේ අඛණ්ඩතාව පවත්වාගෙන යාම අභියෝගාත්මක විය. | නියමිත කාලසීමාව තුළ අපේක්ෂිත අරමුණු සපුරා ගැනීම ව්‍යාපෘතිය විසින් සහතික කළ යුතුය. |

## 3.3 පද්ධති හා පාලන

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- |
| විගණනය කරන ලද අවසාන වාර්තා හරිත දේශගුණික අරමුදලට (GCF) වාර්ෂිකව ඉදිරිපත් කර නොතිබුණි. | අප විසින් අදාළ බලධාරීන් වෙත දන්වා ඇති අතර ඉදිරියේදී විගණන වාර්තා නියමිත වේලාවට හරිත දේශගුණික අරමුදල (GCF) වෙත ඉදිරිපත් කිරීම සහතික කිරීම සඳහා අපි ඔවුන් සමඟ සමීප සම්බන්ධීකරණයෙන් කටයුතු කරන්නෙමු. | විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන, විගණකාධිපතිවරයාගේ වාර්තාව ද සමඟින් ප්‍රමාදයකින් තොරව කඩිනමින් හරිත දේශගුණික අරමුදල (GCF) වෙත ඉදිරිපත් කළ යුතුය. |